# සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**නිවාඩු කාලීන පැවරුම්**

**සැකසුම-මාවනැල්ල අධ්‍යාපන කලාපය**

# 5 ශ්‍රේණිය - පරිසරය(හය වන  සතිය )

**පුනරීක්ෂණ අභ්‍යාස**

1. ශ්‍රී ලංකාවේ භූ විෂමතා දැක්වෙන සිතියම තුළ කඳු , පහත් බිම්,ප්‍රධාන ගංගා , දිය ඇලි සටහන් කර ඇති අයුරු නිරීක්ෂණය කරන්න. හඳුනාගන්න.
2. ඔබ නිවස ආසන්න ප්‍රදේශයේ වගුරු බිමක් හෝ ජලාශ ආශ්‍රිත බිමක් තිබේනම් වසිහිටියෙකු සමගින් ගොස් එම ප්‍රදේශයේ දක්නට ලැබෙන ශාක, සත්ත්ව වර්ග පිළිබඳ තොරතුරු රැස් කරගන්න.
3. ලෝක සිතියම හොඳින් නිරීක්ෂණය කර ශ්‍රී  ලංකාවේ පිහිටීම හඳුනා ගන්න. ශ්‍රී ලංකාවට උතුරින් , දකුණින්, බටහිරින් හා නැගෙනහිරින් පිහිටි රටවල් හා සාගරය හඳුනාගන්න.
4. වර්ෂාව ඇතිවීම සම්බන්ධව පරිසරයේ ඇතිවන වෙනස්කම් පහත ක්‍රියාකාරකම් සිදුකර  හඳුනා ගන්න.
   - I. ප්‍රමාණයෙන් සමාන විශාල ඉවත දමන ලද ප්ලාස්ටික් බෝතල් 2 ක් කපා ගන්න.
   - II. එම බඳුන් දෙකට එකම ස්ථානයකින් ලබාගත් පස් දමන්න.
   - III. මින් එක බඳුනකට ආවෘත්වන ලෙස පස් ආවරණය වන පරිදිතණකොළ පියලි යොදන්න.
   - IV. තණකොළ වැවෙන තෙක් දින කිහිපයක් තබන්න.
   - V. බඳුන් දෙකේ විවෘත කෙළවරින්පහලට වැටෙන ජලය එකතු වීමට විනිවිද පෙනෙන එක හා සමාන බඳුන් දෙකක් තබන්න.
   - VI. බඳුන් දෙකටම සමාන ප්‍රමාණයේ ජලය දමා ගලා යන ජල ප්‍රමාණ හා වර්ණය නිරීක්ෂණය කරන්න.

